# NDDCB NEWSLETTER


VOLUME 41

JULY - SEPTEMBER


NATIONAL DANGEROUS DRUGS CONTROL BOARD

MINISTRY OF PUBLIC SECURITY AND PARLIAMENTARY AFFAIRS

## Vision

“ Build a Drug Free Healthy and Secured Nation”

## දැක්ම

“මත්ද්‍රව්‍ය වලින් තොර සෞඛ්‍ය සම්පන්න සහ සුරක්ෂිත ජාතියක් ගොඩනැගීම”

## Mission

“Provide leadership to ensure healthy live and peaceful society free from drug abuse through develop and effective implementation of National policy, by empowering of all related agencies, community and individuals”

## මෙහෙවර

“අදාළ සියලු ආයතන, ප්‍රජාව සහ පුද්ගලයින් බල ගැන්වීමෙන් ප්‍රතිපත්තිය සංවර්ධනය කිරීම සහ ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම තුළින් මත්ද්‍රව්‍ය භාවිතයෙන් තොර සෞඛ්‍ය සම්පන්න ජීවිතයක් සහ සාමකාමී සමාජයක් සහතික කිරීමට නායකත්වය ලබා දීම”


**ලිපිනය**

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය,
නො. 383,
කෝට්ටේ පාර,
රාජගිරිය.

**Tel – 011 2868794 – 6**

**Fax – 0112 868792 - 1**

**Email – mail@nddcb.gov.lk**

**FB – National Dangerous Drug Control Board**



**සැකසුම**

- හද්‍රා හේරත්
- තිළිණ ප්‍රියංකර

**සෝදුපත් බැලීම**

හිරුණි වත්සලා




# අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය 1984 අංක 11 දරන අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩල පනත යටතේ ස්ථාපනය කර ඇත.

මත්ද්‍රව්‍ය අනිසි භාවිතය ජාත්‍යන්තරව පාලනය කිරීම සඳහා සකස් වූ 1961 මාදක ගණයේ මත්ද්‍රව්‍ය සඳහා වූ කේවල සම්මුතිය (Single Convention on Narcotic Drugs 1961) 1971 මනෝවර්ථක ද්‍රව්‍ය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතිය (UN Convetion on Psychotropic Substances) සහ 1988 එක්සත් ජාතීන්ගේ මාදක හා මනෝවර්ථක නීති විරෝධීව ජාවාරම් කිරීමට එරෙහි සම්මුති පනත (UN Convetion Against Illicit Traffic in Narcotic Drugs and Psychotropic Substances 1988) යන ජාත්‍යන්තර සම්මුතීන් ප්‍රකාරව ශ්‍රී ලංකාවේ මාදක ඖෂධ හා මනෝවර්ථක ද්‍රව්‍ය පාලනය කිරීම සම්බන්ධ කේන්ද්‍රීය ජාතික ආයතනය වශයෙන් අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය කටයුතු කරනු ලබයි.

## මණ්ඩලයේ ප්‍රධාන කාර්යයන්

- මත්ද්‍රව්‍ය දුර්භාවිතය නිවාරණය හා පාලනය සම්බන්ධ ජාතික ප්‍රතිපත්තිය සංශෝධනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම.
- මත්ද්‍රව්‍ය ඇබ්බැහිකාරී පුද්ගලයින් සඳහා ප්‍රතිකාර හා පුනරුත්ථාපන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- විවිධ ඉලක්ක කණ්ඩායම් සඳහා නිවාරණ අධ්‍යාපන සහ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- මත්ද්‍රව්‍ය දුර්භාවිතය ආශ්‍රිත ප්‍රවණතා සමීක්ෂණ සහ වෛද්‍ය, සමාජ, නෛතික, ආර්ථික සහ සංස්කෘතික කාරනා සම්බන්ධයෙන් පර්යේෂණ ක්‍රියාත්මක කිරීම.
- මත්ද්‍රව්‍ය සම්න්ධයෙන් රසායනික විශ්ලේෂණ සිදු කිරීම මගින් ප්‍රතිපත්ති සම්පාදනය සඳහා සාක්ෂි මත පදනම් වූ විද්‍යාත්මක නිර්දේශයන් ලබාදීම සහ පූර්ව රසායන ද්‍රව්‍ය පාලනය කිරීම.
- මත්ද්‍රව්‍ය පාලන කටයුතු වල නිරත ජාතික, කලාපීය සහ ජාත්‍යන්තර ආයතන සමග සම්බන්ධීකරණය පවත්වා ගැනීම.

**මණ්ඩලය යටතේ ක්‍රියාත්මකවන ප්‍රධාන අංශ**

- පර්යේෂණ අංශය
- ප්‍රතිකාර හා පුනරුත්ථාපන අංශය
- නිවාරණ අධ්‍යාපන හා පුහුණු අංශය
- ජාතික මාදක රසායනාගාරය
- බාහිරසේවා අංශය
- නාමෝද්දිෂ්ට හා පෞද්ගලික ප්‍රතිකාර මධ්‍යස්ථාන අංශය
- පූර්වජ රසායන අධිකාරිය



## නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශය.

### රාජ්‍ය නිළධාරීන්ගේ ධාරිතා සංවර්ධන පුහුණු වැඩසටහන.

ප්‍රජාව සහ දරුවන්ගේ සංවර්ධනය උදෙසා ක්ෂේත්‍රය තුළ සේවාවන් සපයනු ලබන රාජ්‍ය නිළධාරීන් සදහා මත්ද්‍රව්‍ය නිවාරණය පිළිබඳ නිවැරදි දැනුම සහ අවබෝධය යාවත්කාලීන කිරීමේ අරමුණින් ධාරිතා සංවර්ධන පුහුණු වැඩසටහන් දිවයින පුරා සිදු කරනු ලබන අතර ඒ මගින් ඔවුන්ගෙන් සේවාව ලබන ප්‍රතිලාභීන් වෙත ගුණාත්මක සේවාවක් සැපයීම සදහා සහ නිවැරදි මැදිහත්කරණයක් සදහා අවශ්‍ය දැනුම සම්ප්‍රේෂණය කිරීම බලාපොරොත්තු වේ. පරිවාස හා ළමාරක්ෂක දෙපාර්තමේන්තු නිළධාරීන් සදහා මත්ද්‍රව්‍ය නිවාරණය පිළිබද දෙදින පුහුණු වැඩසටහනක් නිවාරක  අධ්‍යාපන හා පුහුණු අංශය මගින් ජුලි මස සිදු කරන ලදී.








### මත්ද්‍රව්‍ය නිවාරණය පිළිබඳව පාසල් සිසුන් දැනුවත් කිරීම.

මනා පෞරුෂයකින් සහ සෞඛ්‍ය සම්පන්න බවකින් යුත් අනාගත දරු පරපුරක් බිහි කිරීමේ ප්‍රධානම කාර්යභාරය පාසලට හිමි වී ඇත.මෙකී මෙහෙවර ඉටු කිරීමේ දී පාසලේ ඉගෙනුම් ඉගැන්වීමේ ක්‍රියාවලියට බාධා වන ආකාරයේ අපගාමී චර්යාවන් රැසක් පාසල් පද්ධතිය තුළින් වර්තමානය වන විට නිර්මාණය වී ඇත . මේ අතරින් පාසල් සිසුන්ගේ මත්ද්‍රව්‍ය  භාවිතය පාසල් පද්ධතිය තුළ ගැටළු රැසක් ඇති කර ඇත .එබැවින් පාසල් සිසු සිසුවියන් ඉලක්ක කර ගනිමින් නිවාරණය පිළිබද දැනුම ,ආකල්ප හා කුසලතා පාසල් සිසුන් තුළ ඇති කරලීමේ අරමුණින් මත්ද්‍රව්‍ය නිවාරණය පිළිබද පාසල් සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහන් දීප ව්‍යාප්තව  නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශය මගින් සිදු කරනු ලබයි.
මේ හා සමගාමීව දහම්පාසල්  සහ පිරිවෙන් මූලික කොට ගෙන ද නිවාරණ වැඩසටහන් ක්‍රියාවට නංවනු ලැබේ.
















## පාසල් ගුරුවරුන් පුහුණු කිරිමේ වැඩසටහන.

රටක ජීවනාලිය බඳු දරු පරපුර එම රටේ වර්තමානය හා අනාගතය ශක්තිමත් කරනු ලබන පවුරයි . එකී දරු පරපුර මුහුණ දී සිටින මත්ද්‍රව්‍ය ගැටළුවෙන් ඔවුන් මුදා ගැනීම සඳහා අවශ්‍ය නිවාරණ ක්‍රියාවලිය පාසල තුළ ක්‍රියාවට නංවනු ලබන කණ්ඩායම පාසල් ගුරුවරුන් වේ. එබැවින් ඔවුන් සඳහා ප්‍රායෝගික සාක්ෂි මත පදනම් වූ විද්‍යාත්මක  වැඩසටහන් නිවාරක අධ්‍යාපන අංශය විසින් වාර්ෂිකව දියත් කරන ලබයි.

ඒ යටතේ ජාතික අධ්‍යාපන විද්‍යා පීඨ ශික්ෂණලාභීන් ඉලක්කකොට ගනිමින් පාසල් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ සිසුන් මත්ද්‍රව්‍ය වැනි අපගාමී චර්යාවන්ගෙන් මුදවා ගැනීම සදහා වන නිවාරණය පිළිබද දැනුවත් කිරීමේ පුහුණු වැඩමුළු දිවයින පුරා විද්‍යාපීඨ ශික්ෂණලාභීන් ඉලක්ක කර ගනිමින් නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශයේ නිළධාරීන්ගේ සම්පත්දායකත්වය යටතේ සිදු කරන ලදී.







## තරුණ පාදක නිවාරණ වැඩසටහන සහ පුහුණු කිරීමේ වැඩසටහන.

නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශය මගින් ක්‍රියාවට නංවනු ලබන නිවාරණ වැඩසටහන් අතර තරුණ කණ්ඩායම් ඉලක්ක කොටගත් නිවාරණ දැනුවත් කිරීම් සහ පුහුණු වැඩසටහන් ප්‍රමුඛස්ථානයක් ගනු ලබයි. එයට හේතු වන කරුණ වන්නේ රටේ ප්‍රධාන ශ්‍රම බලකාය ලෙස සමාජගත වනුයේ මෙකී තරුණ කණ්ඩායම වීමයි. වගකීම් සහගත සහ නීරෝගී , සෞඛ්‍ය සම්පන්න තරුණ පිරිසක් සිටීම රටට මහත්

ශක්තියක් වන අතර ඔවුන් සතු විය යුතු එකී නීරෝගීබව හා වගකීම් සහගතබව මත්ද්‍රව්‍ය මගින් විනාශයට පත් කරනු ලබන අතර ඒ මගින් ඔවුන් ශ්‍රම බලකායෙන් මිදී යැපෙන්නන් පිරිසක් බවට පත් කරනු ලබයි. එම තත්ත්වයෙන් ඔවුන් මුදා ගැනීම සඳහා රට පුරා තරුණ කණ්ඩායම් ස්ථානගත වී සිටින විශ්ව විද්‍යාල, යොවුන් සේනාංක, කාර්මික විද්‍යාල, වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන ඉලක්ක කර ගනිමින් සහ ළමා සමාජ , යෞවන බල මණ්ඩල ඉලක්ක කොට ගනිමින් මත්ද්‍රව්‍ය නිවාරණය පිළිබඳ දැනුවත් කිරීම් සහ පුහුණුකරුවන් ලෙස පුහුණු කිරීම නිවාරක අධ්‍යාපනහා පුහුණු අංශය විසින් සෑම වසරකම සිදු කරනු ලබයි.















## මත්ද්‍රව්‍ය නිවාරණය පිළිබඳ දෙමාපිය කුසලතා සංවර්ධනය කිරීම.

මත්ද්‍රව්‍ය නිවාරණය පිළිබඳ දෙමාපිය කුසලතා සංවර්ධනය කිරීම නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශය මගින් සිදු කරනු ලබන වැඩසටහන් අතර සුවිශේෂී වැඩසටහනක් වෙයි. පවුල තුළ තම දරුවන් කුඩා අවධියේ සිටම මත්ද්‍රව්‍ය භාවිතා කිරීමට යොමු වන්නා වූ අවදානම් සාදක අවම කර ගැනීම සඳහා දෙමාපියන් සතු කාර්යය භාරය අතිමහත් වන බැවිනි. පවුල වැනි සමාජය තුළ ඇති ක්ෂුද්‍ර ඒකකයන් මගින්  නිවාරණය පිළිබඳ පණිවුඩ නිවැරදි ලෙස සමාජගත කිරීම මගින් මත්ද්‍රව්‍ය භාවිතය සඳහා වන පෙළඹවීම අවම කර ගැනීම සඳහා මහත් පිටිවහලක් සපයනු ලබයි. මේ හේතුව නිසාම නිවාරක හා පුහුණු අංශය දෙමාපිය කුසලතා සංවර්ධනය කිරීමේ වැඩසටහන් ක්‍රියාවට නංවනු ලබයි.











## නීතිය බලාත්මක කරන නිළධාරීන් සඳහා වන පුහුණු වැඩසටහන.

මත්ද්‍රව්‍ය නිවාරණයේ දී මත්ද්‍රව්‍ය සම්බන්ධ සමාජයේ පවතින ඉල්ලුම අඩු කිරීමට කටයුතු කරන අතරතුර ඒ හා සම්බන්ධ සැපයුම අවම කිරීම සඳහා ද කටයුතු කළයුතු වේ. ශ්‍රී ලංකා පොලීසිය සහ ත්‍රිවිධ හමුදාවට අයත් නිළධාරීන් හට  මේ පිලිබඳ න්‍යායාත්මක හා ප්‍රායෝගික දැනුම ලබා දීම නිවාරක හා අධ්‍යාපන අංශය ක්‍රියාවට නංවනු ලබන තවත් එක් වැඩසටහනක් වේ.







## රාජ්‍ය  සහ පෞද්ගලික අංශයන්හි සේවය කරනු ලබන නිළධාරින් සඳහා වන නිවාරණ වැඩසටහන.

මහජනයාට අවශ්‍ය සේවා සැපයීම ,රාජ්‍ය අංශය මෙන්ම පෞද්ගලික අංශය ද එමෙන්ම රාජ්‍ය නොවන ආයතන මගින් ද සිදු කරනු ලබන අතර මේ සෑම අංශයකින්ම ඵලදායී හා කාර්යක්ෂම සේවාවක් සැපයීමට නම් ආයතන තුළ නීරෝගී සහ සෞඛ්‍ය සම්පන්න නිළධාරීන් පිරිසක් සිටිය යුතු වේ. විශේෂයෙන්ම රාජ්‍ය සේවය තුළ ක්ෂේත්‍ර රාජකාරිවල නිරත නිළධාරින් හට ප්‍රජාවට අවශ්‍ය සේවා

සැපයීමේ දි මත්ද්‍රව්‍ය නිවාරණය, ප්‍රතිකාරය හා පුනරුත්ථාපනය පිළිබද නිවැරදි වූ දැනුමක් තිබීම වැදගත් වේ. ඉහත කී කාර්යයන් සාක්ෂාත් කර ගැනීම සදහා රාජ්‍ය ,රාජ්‍ය නොවන හා පෞද්ගලික අංශ නිළධාරීන් දැනුවත් කිරිම නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශය මගින් සිදු කරනු ලබයි.















## ප්‍රජා දැනුවත් කිරීම් සහ අධ්‍යාපනික ප්‍රදර්ශන.

මත්ද්‍රව්‍ය නිවාරණයේ දී නිවාරණය සම්බන්ධ ප්‍රජාව සතු දැනුම, ආකල්ප හා කුසලතා වැඩි දියුණු කිරීම සදහා දැනුවත් කිරීම් , ප්‍රජා නායකයින් පුහුණු කිරිම මෙන්ම එකවර විශාල ප්‍රජාවක් වෙත නිවාරණ පණිවුඩ බෙදා හැරීම සදහා අධ්‍යාපනික ප්‍රදර්ශන පැවැත්වීම සදහා නිවාරක හා අධ්‍යාපන අංශය තම වැඩසටහන් තුළ වැඩි ඉඩකඩක් ලබා දෙනු ලබයි . මේ තුළින් මත්ද්‍රව්‍ය සදහා ප්‍රජාව සතු ඉල්ලුම අවම කිරීම සදහා ඔවුන් තුලින්ම උද්දේශනයක් ඇති කිරීමත් මත්ද්‍රව්‍යට එරෙහි ධනාත්මක සාධක වැඩි දියුණු කිරීමත් බලාපොරොත්තු වේ.













## 2024 සැප්තැම්බර් මාසය තුල නවදිගන්ත ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථාන කායර් මණ්ඩලයේ සහභාගීත්වයෙන් පැවැත් වූ වැඩසටහන්

නවදිගන්ත ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානයේ සියළු කාර්ය මණ්ඩලයේ සුහදතාව වර්ධනය කිරීම දැනුම යාවත් කාලින කිරීම උදෙසා සහ නේවාසික සේවාලාභීන්ගේ ප්‍රතිකාර ක්‍රියාවලිය ගුණාත්මකව පෝෂණය කිරීම උදෙසා සැප්තැම්බර් මාසයේ පහත සඳහන් කාර්ය මණ්ඩල පුහුණු වැඩසටහන් පවත් වන ලදි.

2024.09.05 මත්ද්‍රව්‍ය ඇබ්බැහිය හා මානසික රෝග සඳහා ලබා දෙන වෛද්‍යමය ඖෂධ ප්‍රතිකාර හා මනෝ විද්‍යාත්මක ප්‍රතිකාර පිළිබඳ පුහුණු වැඩසටහන වෛද්‍ය කළ්‍යාණතිස්ස මහතා ගේ සම්පත් දායකත්වයෙන් නවදිගන්ත ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථාන ශ්‍රවණාගාරයේ පැවැත් විය.







2024.09.10 දින ආතති කළමනාකරණය හා පෞරුෂත්ව ගුණාංග සංවර්ධන පුහුණු වැඩසටහන පෞරුෂත්ව පුහුණු උපදේශක හාතිය අර්ථනායක මහතාගේ සම්පත් දායකත්වයෙන් අත්තනගල්ල ශනුෂි හෝටල් පරිශ්‍රයේ පැවැත් විය.







2024.09.25යෝගා වැඩසටහන ආයුර්වේද වෛද්‍ය කේ.ජ්. උපුල් පද්මසිරි මයාගේ සම්පත්දායකත්වයෙන් කළගෙඩිහේන ග්ලාස්ගෝ හෝටල් පරිශ්‍රයේ දී පැවැත් විය.





2024/09/30 මත්ද්‍රව්‍ය වර්ගීකරණය හා මත්ද්‍රව්‍ය වල රසායනික ක්‍රියාකාරීත්වය පිළිබඳ පුහුණු වැඩසටහනක්, ජාතික මාදක රසායනාගාරය,සහකාර අධ්‍යක්ෂක, අ.ඖ.පා.ජා.ම රංජිත් වික්‍රමගේ මහතාගේ සහභාගීත්වයෙන් නවදිගන්ත ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථාන ශ්‍රවණාගාරයේ පැවැත් විය.





## STD සායනය

2024/09/02 දින වතුපිටිවල මූලික රෝහලේ STD අංශයේ වෛද්‍යතුමා ඇතුලු එම කණ්ඩායම විසින් ලිංගාශ්‍රිතව සම්ප්‍රේෂණය වන රෝග සම්බන්ධ සායනය නවදිගන්ත මධ්‍යස්ථානයේ පැවැත් වූ අතර, සෑම මාස 03 කට වරක්ම මෙම සායනය මධ්‍යස්ථානය තුල පවත් වනු ලබයි.

අද වන විට ලිංගාශ්‍රිතව සම්ප්‍රේෂණය වන රෝග වල වැඩි වීමක් සමාජය තුල පවතින අතර, මත්ද්‍රව්‍ය භාවිත පිරිසක් ලෙස මෙම සේවාලාභීන් හට මෙවැනි රෝග ඇති වීමේ ප්‍රවණතාවය ඉහළය. එබැවින් ලිංගාශ්‍රිතව සම්ප්‍රේෂණය වන රෝගී තත්ව පිළිබඳව නිවැරදි අවබෝධයක් ලබා දීම, දැනුවත් කර වීම සහ මේ වන විට සේවාලාභීන්ට මේ පිළිබඳව පවතින ගැටළු සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට අවස්ථාව සැලසීම මෙන්ම සේවාලාභීන්ගේ ලේ පටල සාම්පල් පරික්ෂාව සිදු කිරීම මෙම වැඩසටහන හරහා සිදු කරනු ලබයි. ඒ අනුව මෙම සායනය සේවාලාභීන්ගේ මනා සෞඛ්‍ය තත්වයක් පවත්වා ගෙන යාම උදෙසා මහඟු පිටි වහලක් වනු ඇත.







# 2024 වර්ෂයේ ජූලි සිට සැප්තැම්බර් දක්වා බාහිර සේවා අංශය විසින් පවත්වනු ලැබූ විශේෂ වැඩසටහන

රත්නපුර දිස්ත්‍රික් තරුණ සේවා බල මණ්ඩල සමාජකයින් සඳහා "සුරක්ෂිත තාරුණ්‍යයක් සඳහා මතින් නිදහස් සමාජයක්" නිර්මාණයට තරුණයින්ගේ දායකත්වය කෙබඳුද යන්න සම්බන්ධව රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේදී පවත්වන ලද වැඩසටහන





ඇසළ පොහොය දිනයේ කෑගල්ල දිස්ත්‍රික්කයේ මාවනැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අලුත්නුවර ශ්‍රී දැඩිමුණ්ඩ දේවාලය සහ ඓතිහාසික කීර්ති ශ්‍රී රාජසිංහ මහා විහාරයේ වාර්ෂික පෙරහර මංගල්‍යය සඳහා සහභාගි වන බැතිමතුන් වෙත මත්ද්‍රව්‍ය නිවාරණය, ප්‍රතිකාර, පුනරුත්ථාපනය පිළිබඳව දැනුවත් කිරීම හා පෙරහැර සඳහා සම්බන්ධවන පෙරහැර කාර්ය මණ්ඩලය (හේවිසිකරුවන්, බෙර වාදකයින්,නැට්ටුවන්, ඇත් ගොව්වන්, ව්‍යාපාරික ප්‍රජාව, ත්‍රීරෝද රථ රියදුරන්) විශාල කණ්ඩායමක් දැනුවත් කිරීමේ ජංගම වැඩසටහනක් සහ ප්‍රදර්ශන කුටියක් අලුත් නුවර දේවාල පරිශ්‍රයේ ස්ථාපිත කරන ලදි.





මාතර, දෙවිනුවර ශ්‍රී විෂ්ණු දේවාලයේ වාර්ෂික පෙරහැර මංගල්‍යයට සමගාමීව බාහිරසේවා අංශයේ මාතර දිස්ත්‍රික් කණ්ඩායම විසින් පවත්වනු ලබන මත්ද්‍රව්‍ය නිවාරණ ප්‍රදර්ශන කුටිය **2024.07.23** දින සිට **2024.07.26** වන දින දක්වා දෙවිනුවර ශ්‍රී විෂ්ණු දේවාල පරිශ්‍රයේ ස්ථාපිත කරන ලදි.

ඊට සමගාමීව දෛනිකව දේවාලය වැඳ පුදා ගැනීම සඳහා පැමිණෙන බැතිමතුන් ඉලක්ක කර ගනිමින් දැනුවත් කිරීමේ වැඩසටහන් ද ක්‍රියාත්මක කරන ලදි.





මහනුවර වාර්ෂික ඇසළ පෙරහැර මංගල්‍යයට සමගාමීව අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ බාහිරසේවා අංශය විසින් සිදුකරන  මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන සහ සේවා සැපයීමේ ප්‍රදර්ශන කුටිය අගෝස්තු මස **10** වන දින සිට **20** වන දින දක්වා මහනුවර නගරය තුළ පවත්වන ලදී.








රත්නපුර සපරගමු මහ සමන් දේවාලයේ වාර්ෂික පෙරහැර මංගල්‍යයට සමගාමීව අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ බාහිරසේවා අංශය විසින් සංවිධානය කරන ලද විශේෂ මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන සමන් දේවාල පරිශ්‍රය කේන්ද්‍ර කරගනිමින් අගොස්තු මස 15 වැනි දින සිට 19 වැනි දින දක්වා පවත්වන ලදි.






මහනුවර දිස්ත්‍රික්කයේ පස්ගම නාථ දේවාලයේ වාර්ෂික පෙරහැර මංගල්‍යයට සමගාමීව අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ බාහිරසේවා අංශය විසින් සංවිධානය කරන ලද විශේෂ මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහනදේවාල පරිශ්‍රය කේන්ද්‍ර කරගනිමින් පවත්වන ලදි.








**Launch of the NDDCB Outreach and Treatment Manuals**

We are excited to announce the successful launch of the NDDCB Outreach and Treatment Manuals on the **22**nd of August **2024!** This important event, held at the NDDCB headquarters, was graced by the presence of representatives from the Japan International Cooperation Agency (JICA), the Commissioner of the Department of Community-Based Corrections, Chairman and staff of NDDCB and other distinguished guests and officers.

These manuals, developed by the Treatment Division and Outreach Unit of the NDDCB, are a testament to our ongoing commitment to enhancing drug prevention and treatment efforts across Sri Lanka. With the generous support of JICA, these comprehensive guides will play a vital role in equipping our teams and partners with the tools they need to make a difference in our communities.

We extend our heartfelt thanks to JICA for their unwavering support and to all who attended the launch event. The manuals are now available for download on our official website. We encourage everyone involved in drug prevention and treatment to utilize these valuable resources.







**Community-Based treatment for Drug Dependent Persons at Nikaweratiya,**The home-based treatment under the program of community -based treatment for drug dependence persons was successfully completed by 64 individuals are in Nikaweratiya police division over a period of 3

months from 2024.04.04 to 2024.07.04. This program was organized by the Nikaweratiya police division and conducted by the National Dangerous Drugs Control Board (NDDCB). A second phase of the program has also started, involving an additional 34 drug users.

Home-based treatment for Substance Use Disorder (SUD) offers significant benefits by providing a familiar and supportive environment for recovery. It allows individuals to maintain their daily routines and family connections, which can enhance emotional stability and motivation. This approach reduces the stigma associated with treatment, increases accessibility for those unable to attend in-patient facilities, and fosters a more personalized and comfortable recovery process.





"Better Place for Better Work," the outreach unit of the NDDCB, conducted an awareness program for the workers of Nortel International PVT LTD intending to create a safe and better workplace free from drugs. This initiative aims to educate employees about the dangers of drug use and promote a healthy, drug-free environment








**Prevention Campaign Parallel to Nallur Kovil Annual Festival**

The NDDCB Outreach Team, in collaboration with the Jaffna Volunteer Team, successfully conducted a comprehensive drug prevention campaign alongside the Nallur Kovil annual festival. The campaign included public awareness activities such as pocket meetings, group discussions, and interactive quiz competitions for children. Our teams engaged with the community through meaningful interactions and met with the Government Agent of the Jaffna

District to discuss ongoing efforts. The campaign also featured posters and banner displays targeting the large number of attendees at the festival.

Together, we strive to create a drug-free community and raise awareness of the importance of prevention





**Prevention campaign at Mahiyangana Temple**

Over the past few days, the Outreach Unit of NDDCB led a drug prevention campaign alongside the Mahiyangana Esala Perahera at the historic Mahiyangana Temple. With support from the Badulla District Development Officers team, we set up an exhibition stall for awareness. We appreciate Sirasa TV for the media coverage, the Mahiyangana Divisional Secretariat for facilitation, and MASS Company for their financial support. Together, we're advancing our community's awareness and health.





NDDCB Outreach Unit, with the incredible support of volunteers and representatives from the Mannar District Secretariat, successfully conducted a Drug Prevention Campaign parallel to the annual festival of Madu Church, Mannar.

Together, we raised awareness about the adverse consequences of drug abuse and evidence-based facts, provided vital counseling and referral services, and shared prevention resources with

the festival attendees. A heartfelt thank you to all the volunteers and partners for their unwavering dedication to this cause!







# පර්යේෂණ අංශය

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ පර්යේෂණ අංශය විසින් මත්ද්‍රව්‍ය දුර්භාවිත දත්ත ඇගයීම් පද්ධතිය පවත්වාගෙන යනු ලබයි. ලංකාවේ සියලුම පොලිස් ස්ථාන හරහා මෙම දත්ත පද්ධතියට දත්ත ලැබෙන අතර අන්තරායකර ඖෂධ සම්බන්ධයෙන් අත්අඩංගුවට ගන්නා පුද්ගලයින්ගේ තොරතුරු ඇතුළත් කරනු ලැබේ. මෙම දත්ත පද්ධතියට ලබා දෙන දත්ත වල ගුණාත්මකභාවය පිළිබඳ ගැටලු මතුව ඇති බැවින් එම ගැටලු වළක්වාගෙන ගුණාත්මක දත්ත ගෙන්වා ගැනීමට පොලිස් බල ප්‍රදේශ මට්ටමින් පොලිස් මත්ද්‍රව්‍ය කාර්යාංශය හා පර්යේෂණ අංශය එක්ව පුහුණු වැඩසටහන් පැවැත්වීමට සැලසුම් කරන ලදි.

ඒ අනුව දකුණ, වයඹ, බස්නාහිර, උතුරුමැද පළාතේ පොලිස් කොට්ඨාශ නියෝජනය වන පරිදි පුහුණු වැඩසටහන් 12ක් පවත්වන ලදි. ගාල්ල, ඇල්පිටිය, මාතර, තංගල්ල, කුරුණෑගල, නිකවැරටිය, කුලියාපිටිය, පුත්තලම, හලාවත, කලුතර, ගල්කිස්ස, පානදුර, කැලණිය, නුගේගොඩ, ගම්පහ, මීගමුව, අනුරාධපුර, කැබිතිගොල්ලෑව සහ පොළොන්නරුව යන පොලිස් කොට්ඨාශවල සියලුම පොලිස් ස්ථානයන්හි දූෂණ මර්දන අංශයේ ස්ථානාධිපතිවරුන් සහ වී පී එන් රාජකාරියේ නිරත නිලධාරීන් 775 දෙනෙකු සහභාගි විය.

එහිදී විද්‍යාත්මක සාක්ෂි මත පදනම් ව මත්ද්‍රව්‍ය දුර්භාවිතය සහ නව ප්‍රවණතා පිළිබඳ පුහුණු වැඩසටහන හරහා නව මත්ද්‍රව්‍ය හඳුනා ගැනීම, මත්ද්‍රව්‍ය ව්‍යාප්තිය පිළිබඳ ගෝලීය තත්වය සහ ලංකාවේ තත්ත්වය, මත්ද්‍රව්‍ය ආශ්‍රිත නව ප්‍රවණතා පිළිබඳ දැනුවත් කිරීම සහ පවතින නීති පද්ධතිය සම්බන්ධයෙන් දැනුවත් කිරීම සිදු කරන ලදි.





කිරුළයි ලොවක් පතනා

ඔබමයි හෙටක් ගෙනෙනා

ගුලිවී නිදනා-මායා දකිනා

ඒ රසයද ඔබ සොයනා

කෙසඟ සිරුරු ගෙන-පියවී ලොවෙන් පැන

කෙලෙසද ඔබ මේ ලොව ජයගන්නේ

වැදූ මවට විනා-කරන ඔබේ පන

කළට නොවේ එය වැනසී යන්නේ

ගුලිවී නිදනා-මායා දකිනා

ඒ රසයද ඔබ සොයනා

සිපිරි ගෙදර යන - යොවුන් තුරුණු කම

අඳුර මැදින් පැන වියපත් වන්නේ

දහම් සතුට පිරි -සොඳුරු ලොවක සිරි

නොදැන නොදැක ඔබ නිරයට යන්නේ

බුද්ධික ශ්‍යාමන් ජයතිස්ස,
ග්‍රාම ශක්ති සංවර්ධන නිලධාරී,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
- උඩපළාත -

Scanned with CamScanner

# NDDCB ප්‍රතිකාර මධ්‍යස්ථාන



## Kandy

"Kandy" Youth Prevention,
Treatment& Rehabilitation Centre
Mampitiya Estate Handessa,
Peradeniya
Tel : +94 81 2315504




## Nawadiganthaya

"Nawadiganthaya" Prevention,
Treatment & Rehabilitation Centre
Urapola, Nittambuwa
Tel : +94 33 2283060
Fax : +94 33 2283060
Email : navadiganthaya@nddcb.gov.lk



## Talangama

"Talangama" Prevention, Treatment &
Rehabilitation Center
172, Shanthi Mawatha, Talangama
Tel : +94 11 2788090
Fax : +94 11 2788090
Email : sethsevana@nddcb.gov.lk



## Galle

"Galle" Prevention, Treatment &
Rehabilitation Centre
Unawatuna Galle
Tel : +94 91 2224443
Fax : +94 91 2224443
Email : mithsevana@nddcb.gov.lk